# 2.58 යටත්විජිත අවධියේ ශ්‍රී ලංකාවේ විහාර ගොඩනැගිළිවල කුළුණු කොළඹ දිස්ත්‍රික්කයේ විහාරවලට විශේෂිතව කරන ලද අධ්‍යයනයක්

ශ්‍රියාණි හතුරුසිංහ[1]
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

## ABSTRACT

බටහිර ජාතීන් විසින් මෙරට යටත්විජිතයක් බවට පත්කරගනු ලැබූ පසුව ඔවුන්ගේ සංස්කෘතික, ආගමික, දේශපාලන, ආර්ථික හා සමාජීය ලක්ෂණ මෙරටට විශාල බලපෑමක් ඇතිකර තිබේ. එම ලක්ෂණ බොහොමයක් වර්තමානය දක්වාද ඉතිරිව ඇත. ඒ අතරින් වාස්තු විද්‍යාත්මක ක්ෂෙත්‍රයට ඇතිකළ බලපෑම පිළිබඳව අධ්‍යයන කිරීමට ඉතිරිවී ඇති ප්‍රබල පුරාවිද්‍යාත්මක සාක්ෂි රාශියකි. යටත් විජිත පාලනය දැඩි ලෙස ව්‍යාප්ත වු දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශයේත්, රට අභ්‍යන්තරයේ මහනුවර, මාතලේ හා නුවරඑළිය යන ප්‍රදේශවලත් මෙම වාස්තු විද්‍යාත්මක ශේෂයන් බහුලව දක්නට ලැබේ. මේ පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වන්නේ බටහිර ජාතීන්ගේ වාස්තු විද්‍යාවේ එක් අංගයක් වූ කුළුණු (චසකක්රි) තත්කාලීන ශ්‍රී ලාංකවේ විහාර වාස්තු විද්‍යාවට යොදාගත් අකාරයත්, එම කුළුණු දේශිය කුළුණු වලින් වෙනස්වන ආකාරයත් පරීක්ෂා කිරීමයි.

පූර්ව යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ගොඩනැගිලිවල කුළුණු ශිලාමය හා දැවමය අමුද්‍රව්‍ය භාවිතාකර නිර්මාණය කර ඇත. බටහිර ජාතීන් ඒ වෙනුවට ගඩොලින් කුළුණු ඉදිකිරීම හඳුන්වා දී තිබේ. එමෙන්ම දේශීය කුළුණු සිවුරැස්, ෂඩාශ්‍රාකාර, අටාශ්‍රාකාර හා වෘත්තාකාර හැඩයෙන් යුක්ත වූ අතර බටහිර ගෘහ නිර්මාණ ශිල්පයේ කුළුණු වෘත්තාකාර හැඩය පමණක් ගෙන තිබේ. කුළුණු පාදම්, කුළුණු හිස, හා කුළුණේ යෙදූ මෝස්තර යනාදිය දේශීය කුළුණුවලට වඩා වෙනස්වන ආකාරය පැහැදිලිවම හඳුනාගත හැකිය. මෙම පර්යේෂණය සඳහා යටත්විජිතවාදීන්ගේ පාලන කේන්ද්‍රස්ථානය ලෙස පැවති කොළඹ දිස්ත්‍රික්කයේ පැරණි බෞද්ධ විහාරස්ථානවල කුළුණු අධ්‍යයනය කරන ලදී.

**Key words** : යටත්විජිත අවධිය, වාස්තු විද්‍යාව, කුළුණු